| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | | දිනය<br>திகதி<br>Date. |
| ඔබේ අංකය<br>உமது இல.<br>Your No . | | |

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
## இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
## Human Rights Commission of Sri Lanka

සභාපති
ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව
රාජගිරිය.

ගරු සභාපතිතුමනි,

**<u>මහ මැතිවරණය 2020 - මානව හිමිකම් කොමිෂන් සභාවේ යෝජනා/නිර්දේශ</u>**

ප්‍රථමයෙන් මේ අභියෝගකාරී වාතාවරණය යටතේ සාධාරණ හා නිදහස් මහ මැතිවරණයක් පැවැත්වීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් දරණ උත්සාහය පිළිබඳව අපගේ කෘතඥතාවය පළ කරන්නෙමු.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පසුගිය 2019 ජනාධිපතිවරණය සමයේ සිදුකරන ලද අධීක්ෂණ කටයුතු තුළින් ලබාගන්නා ලද අත්දැකීම් හා නිරීක්ෂණ ඇසුරින් සහ වර්ථමාන කොවිඩ් 19 තත්වය තුළ නිරෝධායනය සහ රෝග වැළැක්වීමේ ආඥාපනතේ 2 වන සහ 3 වන වගන්ති යටතේ සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යවරිය විසින් නිකුත් කරන ලද නියෝගයන්ද පදනම්ව ඔබ කොමිෂන් සභාව වෙත මේ මහ මැතිවරණය පැවැත්වීමේ දී මානව හිමිකම් ප්‍රමිතීන් පිළිබඳ අනුකූලතාවය වඩාත් සාර්ථක කරගැනීම සඳහා පහත දැක්වෙන යෝජනා/ නිර්දේශ ඉදිරිපත් කරන්නෙමු:

01. නිරෝධායනය සහ රෝග වැළැක්වීමේ ආඥාපනතේ 2 වන සහ 3 වන වගන්ති යටතේ සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යතුමිය විසින් නිකුත් කරන ලද නියෝගයන්හි මැතිවරණ දිනයේදි ජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂා කිරිම සඳහා ඡන්දපොළවල ගතයුතු ක්‍රියාමාර්ග විස්තරාත්මකව දන්වා නැත. තම ඡන්දය භාවිතා කිරීම වැදගත් මානව හිමිකමක් බැව් ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දක්වා ඇත. මෙවර සෞඛ්‍ය හේතූන් පදනම් කරගෙන යම් ඡන්ද දායකයින් විසින් තම ඡන්ද අයිතිය භාවිතා කිරීමට පසුබට විය හැකි වේ. එබැවින් ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව විසින් ඉතා පැහැදිලි ලෙස සෞඛ්‍ය මාර්ගෝපදේශ තම කාර්ය මණ්ඩලය වෙතත්, ඡන්දදායකයින් වෙතත් මැතිවරණ දිනයට පෙර ලිඛිතව ලබාදීම අතිශයින් වැදගත්වේ.

02. මැතිවරණයකදි ඡන්දය භාවිතා කිරීම අහිමිවිමකට හේතුවන, එම මැතිවරණයේදි ඡන්දය භාවිතා කිරීම සඳහා හිමිකම ලැබෙන වසරේ මැතිවරණ නාම ලේඛනයණයට යම් ඡන්ද දායකයෙකුගේ නම පරිපාලනමය අතපසුවීමක් හේතුවෙන් ඇතුළත් වී නොමැති නම් ඒ පිළිබඳව ඔබ කොමිෂන් සභාව විසින් කඩිනම් විසඳුම් ලබාදීම ඉතා වැදගත් වේ. පසුගිය ජනාධිපතිවරණයේ දී එවැනි හේතූන් නිසා ඡන්ද අයිතිය නොලැබී ගිය ඡන්ද දායකයින් පිළිබඳ අප කොමිෂන් සභාවට දැනගැනීමට හැකි විය. එය බලවත් ලෙස මැතිවරණයක සාධාරණ බව හීන කරවන්නා වූ තත්වයකි.

03. සියළු ආකාරයේ ආබාධ සහිතවූවන්හට ඡන්දය භාවිතා කිරීමට පැමිණීමට බාධාවන ප්‍රවේශ ගැටළු සහ ඡන්දය භාවිතා කිරීමේ දී පිළිගත හැකි ක්‍රමවේද තහවුරු කිරීම ˝කිසිවෙකුත් අත් නොහැරෙන මැතිවරණයක් තහවුරු කිරීම˝ සඳහා බෙහෙවින් උපකාරී වනු ඇත.

04. ඡන්දය භාවිතා කිරීමෙන් පසුව පුද්ගලයින් ඡන්දය භාවිතා කළේ කාටද යන අනන්‍ය කරුණ හෙළිකර ගැනිමට ඉඩ ප්‍රස්ථා ඇත්නම් ඒවා ඉවත් කිරීම.


| | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය<br>தலைமைக் காரியாலயம்<br>Head Office | 14, ආර්. ඒ. ද. මෙල් මාවත, කොළඹ - 04.<br>14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு-04.<br>14, R.A.De Mel Mawatha, Colombo - 04. | සභාපති<br>தவிசாளர்<br>Chairperson | 011-2505451 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011 2505541/74 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 94-11- 2505580/81/82 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 011-2505521 | ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline | 011-2505575<br>1996 |
| විද්‍යුත් තැපෑල<br>மின்னஞ்சல்<br>E-mail | sechrcsl@gmail.com | වෙබ්<br>இணையம்<br>Web | www.hrcsl.lk | | |

05. එක් ජනවර්ගයකට හෝ ආගමික ප්‍රජාවන්ට අයත් වන ස්ථාන ඡන්ද මධ්‍යස්ථාන ලෙස භාවිතා නොකිරීම.

06. භූගෝලීය වශයෙන් හුදකලා ප්‍රදේශවල (දූපතක් හෝ මාර්ග පහසුකම් නොමැති කඳුවැටි හෝ විශාල වනාන්තර බාධාවක් ලෙස පවතින ප්‍රදේශ) ඡන්ද දායකයින්ට සිය ඡන්දය භාවිතා කිරීමට හැකිවන ලෙස පහසු සහ ප්‍රායෝගික ක්‍රමවේදයක් සකස් කිරීම.

07. භික්ෂුණීන්හට ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමේ ක්‍රමවේදයේ ගැටළුවක් පවතින බැවින් ඒ සඳහා ප්‍රායෝගික විකල්ප ක්‍රමවේදයක් ලෙස මැතිවරණය සඳහා සැකසූ විශේෂ හැඳුනුම්පතක් හඳුන්වාදීම. එහිදී " පූජ්‍ය පක්ෂය" ලෙස හැඳුනුම්පතෙහි පොදුවේ දැක්වීම මඟින් භික්ෂුණීන්හට ද සිය ඡන්දය භාවිතා කිරීමට අවස්ථාව සලසාගත හැකිය.

08. ආගමික පෙරහැර, ආගමික උත්සව ආදිය සාම්ප්‍රදායිකව නොපැවැත්වෙන කාල වකවානුවල ඡන්දය ඉලක්ක කර මැතිවරණ ප්‍රවර්ධනය සඳහා ආගමික උත්සව/පෙරහැර සංවිධානය කිරීම වැලැක්වීම.

09. පෙරහැර/පෙළපාලි/රථ පෙළපාලි පිළිබඳ මැතිවරණ නීතිය පශ්චාත් මැතිවරණ සමයේ තදින් ක්‍රියාත්මක කිරීම.

10. මැතිවරණ සමයේ අතිරේක ආරක්ෂාව යෙදවීම ඡන්ද දායකයින් පැමිණීම වැලැක්වීම සඳහා නොව ඡන්දයේ නිදහස්, සාධාරණ හා බලපෑමකින් තොර තත්වය පවත්වාගෙන යාම සඳහා යන හැඟීම ඇති වන ආකාරයට කටයුතු කිරීම.

11. රාජ්‍ය ආයතන තුළ මැතිවරණ වලින් අනතුරුව පරාජිත පාක්ෂිකයින්ට සිදුවන අඩන්තේට්ටම් ඇතිවීම වැලැක්වීමට පියවර ගැනීම.

12. මැතිවරණ වලින් අනතුරුව පරාජිත පාක්ෂිකයින්ට ගම්මට්ටමේ සිදුවන අඩන්තේට්ටම් ඇතිවීම වැලැක්වීමට පියවර ගැනීම.

13. මැතිවරණ සමයේ රාජ්‍ය සහ පෞද්ගලික මාධ්‍ය ක්‍රියාත්මකවීම තුළ පුද්ගලයින්ගේ ඡන්දය භාවිතා කිරීම නිදහස්, සාධාරණ හා බලපෑමකින් තොරව සිදුකිරීම සඳහා ඉවහල්වන ලෙසින් නිකුත් කොට ඇති මාධ්‍ය උපමාන සහ මාර්ගෝපදේශ ප්‍රායෝගිකව භාවිතාවීම පිළිබඳ නියාමනයක් සිදුකිරීම.

සභාපතිනිය,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

2020 ජූලි මස 24